# 21 වන සියවසට ජල සම්පත් කළමනාකරණයේ අවශ්‍යතා

ජලය ස්වාභාවික සම්පතක් වන අතර එය ජීව රුධිරයකි. මිනිසාට මෙන්ම සතා සිවුපාවා, ගහකොල සහ පරිසරයේ පැවැත්ම උදෙසා ජල සම්පතින් වන්නේ මහගු කාර්යයකි. ජලය නැත්නම් ජීවීන්ගේ හා ශාකවල පැවැත්මක්ද නැත. ජිවියාගේ ශරීරයේ 80% ක් පමණ අඩංගු වන්නේ ජලයයි. මිනිසා හා ජලය අතර ඇත්තේ කිසිදා බිඳිය නොහැකි සම්බන්ධතාවයකි. එමෙන්ම ජලය ආර්ථික, සංස්කෘතික, සෞන්දර්යාත්මක මෙන්ම සමාජයේ රඳා පැවැත්මට ඉතාමත් අත්‍යාවශ්‍යයි. අතීතයේ සිටම ජලය දේවත්වයෙන් සැලකූ අවස්ථා පවතී. එහි වැදගත්කම් නිසා සියළුම ආගම්වල ජලය ශුද්ධ වස්තුවක් ලෙස අදටත් පිළිගනී.

ලෝකයේ බොහෝ සංස්කෘතීන් හා සමාජ පරිනාමයන් ජලය හා සම්බන්ධ විය. ගංගා නිම්න පදනම් කරගෙන ජනාවාස බිහිවී ඇත. සෑම පැරණි සිංහල රජකෙනෙක්ම පාහේ ජල සම්පතෙහි වටිනාකම මැනවින් තේරුම් අරගෙන මහා පරිමාන ජලාශ, කුඩා වැව්, විශාල ප්‍රමාණයක් සකස් කර රට කෘෂිකර්මයෙන් දියුණු කරමින් ජලය මනා ලෙස සංරක්ෂණය කිරීමට කටයුතු කර ඇත. 'අහසින් වැටෙන එකදු දියබිඳක් හෝ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට නොයවනු' යැයි සිංහ නාද කල මහා පරාක්‍රමබාහු වැනි නරපතියන් ක්‍රි.ව. 1153 - 1186 නොසිටියේ නම් කොතරම් ජල සම්පතින් අනූන රටක් වුවත් වර්තමානයේ අප රට විශාල ජල අර්බුදයකට මුහුණ දෙනු නොඅනුමානය.

'කොන්ඩු වටවාන සෙල්ලිපිය සිව්වෙනි දප්පල රජ දවස දිගාමඩුල්ලේ අරගම සඳහා පනවන ලද නියෝගයකි' එහි සඳහන් වන්නේ,

කුඹුරු ගැලීම නොහොත් දියර ඉක්මවා වතුර යාමට ඉඩ හැරීමේ වරදට අක දෙකක් නියම කල යුතුය.

- පමාවූ සීසෑමේ වරදට කලං පහක දඩයක් නියම කල යුතුය.
- නියම කරන ලද දඩයක් ගෙවීම විරුද්ධ වුවහොත් අනිත් ගම්වාසීන් විසින් ඒ ගැන නිශ්චය කල යුතුය.

මේ ආකාරයෙන් පැරණි හෙල රජදරුවෝ ජලයේ ඇති වටිනාකම මැනවින් තේරුම් ගත්හ. කෘෂි ආර්ථිකයේ පෝෂණය ලැබූ රටේ ආර්ථික සුභසිද්ධිය වෙනුවෙන් ඔවුන් නිරන්තරයෙන් ජලය එක් රොක් කර ගැනීමට කටයුතු යෙදූහ. රජරට ප්‍රදේශ මුල් කරගත් වැව් පද්ධති හා ඒවා යා කෙරුණු විශ්මිත වාරමාර්ග පද්ධතිය අදටත් කියා පාන්නේ මේ පිළිබඳ අගනා පාඩමකි.

එදා රජ දවස වාරමාර්ග ක්‍රම සුරක්ෂිත කිරීම සඳහා බෙහෙවින් භාවිතා කල වාරිමාර්ග පද්ධතිය සුරක්ෂිත කිරීම සඳහා ජල කළමනාකරණය හොඳින් කරන ලදී. මහ වැවක් පවතින සෑම ගම්මානයක් වැවට පෝෂණය සැපයුයේ වැව් තාවුල්ල මගිනි. එම වන රොදයෙන් බලාපොරොත්තු වන්නේ උල්පත් ආරක්ෂා කිරීමකි.

එම වැව් කළමනාකරණය සඳහා 'වැව් විදානේ' සහ 'වෙල් විදානේ' නමින් වැටුප් නොලබන තානාන්තරය සඳහා පමණක් රාජකාරිය කිරීමට බැඳී සිටී. වැවේ වතුර අඩුවන කාල සීමාවලදී වතුර බෙදා දිය හැකි සීමාවක්ද සාධාරණය ඉටුවන කුඹුරු වගා කරන කළමනාකරණය එදා තිබුනි.

පෘථිවිගෝලයේ 2/3 ක් පමණ ප්‍රදේශයක් ඇත්තේ ජලයෙනි. ඒ නිසා ජලය අපට අසීමිත සම්පතක් ලෙස සැලකිය හැක. එසේ වුවද මෙම ජල ප්‍රමාණයෙන් 97.2% වැසී ඇත්තේ කරදිය ජලයෙන්ද, 2.1% ග්ලැසියර් හා අයිස් කඳු 0.009% ඇළ දොල හා වැව් පොකුණු වලින්ද, 0.001% භූගත ජලයද, 0.62% පාංශු ජලයද,0.001% ජල වාෂ්පවලින් සමන්විතයි. පානීය ජලය සඳහා පිරිසිදු තත්වයෙන් පවතින්නේ 1% වඩා අඩු ප්‍රමාණයකි. මෙවැනි සීමාකාරී තත්වයක් යටතේ ලෝකයේ වැඩිවන ජනගහනයත් සමගම ඉදිරි දශක 2 තුළ ලෝක පානීය ජල ඉල්ලුම 40% දක්වා ඉහල යනු ඇතැයි ගණන් බලා ඇත. දැනට ලෝක ජනගහනයේ 18% කට පමණ පිරිසිදු පානීය ජලය නොලැබෙන අතර කෝටි 250කට ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් නොමැත. වසර 2025 වන විට ලෝක ජනගහනයෙන් 2/3 ක්ට පමණ පානීය ජලය ලබා ගැනීමට නොහැකි වෙතැයි ගනන් බලා ඇත. එමෙන්ම එක් පුද්ගලයෙකුට ලැබෙන ජල ප්‍රමාණය වර්තමාන ලැබෙන ජල

ප්‍රමාණය මෙන් තුන් ගුණයකටත් වඩා අඩුවේ. අපිරිසිදු ජලය හා නිසි සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීමෙන් දිනකට ලෝකයේ ළමුන් 6000 ක් පමණ පාචනය හා කොලරාව වැනි රෝග වලින් මිය යන අතර පණු රෝග හා මදුරු උවදුරු වලින් විශාල වශයෙන් රෝග ආබාධ ඇති කරයි. මෙහි ප්‍රතිඵලය විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල පිරිසිදු පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් නොලැබීම හේතුවෙන් විශාල සෞඛ්‍ය තර්ජන එල්ල වී ඇති බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ තොරතුරු වලින් පෙන්නුම් කරයි.

විද්‍යාව හා තාක්ෂණය දියුණුවත්, ජනගහන වර්ධනය, ගෝලීයකරණය වීමේ ක්‍රියාදාමය තුළ කාර්මීකරණය හා නාගරීකරණය වීම තුළින් මිනිස් අවශ්‍යතා වර්ධනය වෙමින් පවතී. එම අවශ්‍යතාවයන් තුළ සම්පත් භාවිතය අධිකවීම නිසා ඒවාට තර්ජනයන් එල්ලවී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය ශත වර්ෂය තුල ලොව ජල පරිභෝජනය 6 ගුණයකින් වැඩි විය. එක්සත් ජාතීන්ගේ ලේඛනවලට අනුව ජනගහන වර්ධනය මෙන් දෙගුණයක් වැඩිය.

ඒ සමගම මිනිසුන්ගේ අවිධිමත් ජීවන රටාව, ජනගහනය වැඩිවීම, පරිසර දූෂණය, රසායනික ද්‍රව්‍ය භාවිතය අධික වීම හේතුවෙන් එදා දක්නට නොතිබුණු පාරිසරික ගැටළු රාශියකට අද මිනිසාට මුහුණදීමට සිදුවී ඇත. විශේෂයෙන් හෘදයාබාධ, වකුගඩු රෝග, පිළිකා රෝග, මානසික රෝග වැනි රෝග අධික වෙන බව වාර්තා වී ඇත.

ලෝකයේ අනිකුත් රටවල් හා සසඳා බලන විට ශ්‍රී ලංකාව ජල සම්පතින් අනූන රටකි. රට මධ්‍යයේ පිහිටි මධ්‍යම කඳුකරය ප්‍රධාන කොට ගත් කඳුකර ප්‍රදේශ වලින් ගලා හැලෙන ගංගා ඇළ දොළ ඇතුළු දිය කඳුරු රාශියක් අරීය ජලවහන පද්ධතියෙන් නිර්මානය කරමින් දසතින් ගංගා 103 ක් ඔස්සේ මුහුදට ගලා බසිති. ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2000 ක් පමණ වන අතර එය ලංකාවේ වර්ග කිලෝමීටර 65610ක භූමිය තුළ පැතිර පවතී.

මෙම ජලයෙන් 31% පමණ ගංගා ඔස්සේ මුහුදට ගලා බසින අතර ඉතිරි ප්‍රමානයෙන් කොටසක් බෝග හා තුරුලතා මගින් උරා ගන්නා අතර අනික් කොටස වායු ගෝලයට වාෂ්පවී යයි. නමුත් මෙම ජලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගනිමින් පරිහරණය කරන කොටසක් සිටින නමුත් ජලය බීමටවත් දිය පොදක් සොයාගත නොහැකිව සැතපුම් ගණනක් පා ගමනින් ගොස් වැලි පොලව හාරා පොල් කටුවෙන් දිය එකතු කරන කොටසකුත් අප රටේ සිටිති. වර්ෂාව දිනපතා ලැබෙන දෙයක් නොවේ. එහෙත් ජලය සෑම මිනිසකුටම දිනපතා ලැබිය යුතුය. මෙම අවශ්‍යතාවය පවත්වාගෙන යාම සඳහා ගංගා පරිසර පද්ධතිය ආරක්ෂා විය යුතුය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජල පරිහරණය පහත සඳහන් ලෙස සිදුවෙයි.

| | දැනට පවතින තත්වය | අපේක්ෂිත තත්වය |
|---|---|---|
| වර්තමාන කෘෂිකර්ම | 85% | 65% |
| ගෘහස්ථ පරිභෝජනය | 0.6% | 20% |
| කර්මාන්ත, පාරිසරික අවශ්‍යතා | 0.9% | 15% |

මෙසේ ජලයේ ඉල්ලුම විවිධ පැති තුළින් වර්ධනය වෙමින් පවතියි. විද්‍යාව හා තාක්ෂණ දියුණුව හා ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් නාගරීකරණය හා කාර්මීකරණය වෙමින් පවතියි. ඒ නිසා අනාගතයේදී ජල ඉල්ලුම විවිධාකාරයෙන් වර්ධනය වෙමින් පවතී. එමෙන්ම ජලය පිළිබඳ අත් නොදුටු ගැටළු රාශියකට මුහුණදීමට සිදුවේ.

එමෙන්ම ස්වාභාවිකව බලපාන නියගය ඇතුළු ව්‍යසනයන් මෙන්ම වන විනාශය, ජනගහන වර්ධනය, නාගරීකරණය මතුපිට හා භූගත ජලය මිනිසා විසින් දූෂණයට ලක් කිරීම නිසා පරිභෝජනයට ගත නොහැකි ජලයද සීමා වෙමින් පවතියි. 2025 වන විට වර්තමාන ජනගහනය මිලියන 19 මිලියන 23 දක්වා ඉහලයන බව ඇස්තමේන්තු කර ඇත. එම ජනගහනයෙන් 60% ක් නාගරික ජනගහනය වන බව ඇස්තමේන්තු කර ඇත. වර්තමානයේ නල මාර්ගයෙන් ජලය සැපයෙන්නේ 32% වන අතර එහි ඉල්ලුම අධික වෙමින් පවතී. පසුගිය ජල දශකය තුල පැවති තේමාව වුයේ '2025 දී සැමට පිරිසිදු ජලය' යි. එම නිසා එම අරමුණ කරා ලගා වීමට සීමිත ජල සම්පත් කළමනාකරණය කිරීම ඉතා අත්‍යාවශ්‍යයි.

අද උදාවී ඇත්තේ ජල කළමනාකරණය පිළිබඳ ඉතාම කනගාටුදායක යුගයකි. එහි ප්‍රතිඵලයක් ලෙස අද වැව් ඉස්මත්තේ වන රොදක් වෙනුවට හෝටල්, නිවාස, නිවාඩු නිකේතන, වැනි දේවල් බිහිවී ඇත. කෙසේ හෝ වර්තමානය වන විට එදා තිබුණු ජල කළමනාකරණය පිරිහී ඇත. එයට බොහෝදුරට බලපා ඇත්තේ ඉහළ යන අධික ජනගහනය හමුවේ ජලයට විශාල ඉල්ලුමක් පැවතීමයි. එදා ජලයට ඉල්ලුමක් තිබුනේ ගොවිතැනට, ගෘහස්ථ පරිභෝජනයට වන අතර වර්තමානයේ ජල ඉල්ලුම නොයෙකුත් කටයුතු සඳහා ව්‍යාප්ත වී ඇත. ගෘහස්ථ පරිභෝජනය, කෘෂිකර්මාන්තය, කර්මාන්ත, නාගරික අවශ්‍යතාවයන්ට, විනෝද කටයුතු ජල විදුලිබල නිපදවීම, ක්‍රීඩා, ඉස්සන් කර්මාන්තය වැනි අවශ්‍යතාවයන් සඳහා ව්‍යාප්ත වී ඇත.

කෙසේ වෙතත් එදා නොතිබුන ජල ඉල්ලුම අද වන විට අධික ලෙස වැඩිවී ඇති අතර ජල සැපයුම සීඝ්‍රයෙන් අඩු වෙමින් පවතින අතර අනාගතයේදී ජල ඉල්ලුම අධික ලෙස ඉහළ යා හැකිය. ගෝලීකරණය නිසා ජලය පිළිබඳ අත් නොදුටු නව ගැටළු රාශියකට සමාජයට මුහුණදීමට සිදුවෙයි.

ලෝකයේ බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේ මිනිසා මෙතෙක් මුහුණ දුන් සියළුම සංස්කෘතීන් හා ස්වාභාවික විපත්වලට වඩා විශාල විපතකට ජලය සම්බන්ධයෙන් මුහුණ පා සිටියි. මේ අර්බුදයෙන් කිසිම රටක් මිදී නැත.

සීඝ්‍ර ජනගහන වර්ධනයත් සමග ඇතිවූ කර්මාන්ත ව්‍යාප්තිය සහ නාගරීකරණය වීමෙන් ජලය සඳහා ඉල්ලුම වැඩිවී ඇත. ජනගහනය වැඩිවීමත් සමගම ඉඩම් හිඟවීම, වනාන්තර එළිකිරීම, පහත් බිම් ගොඩ කිරීම වැනි අවිධිමත් ඉඩම් පරිහරණයන් නිසා භූගත සහ ගංගා වල ජල ප්‍රමාණය අඩුවීමට බලපා ඇති අතර මේ හේතූන් නිසා පාරිසරික මෙන්ම ජලය දූෂණය සීඝ්‍රයෙන් සිදුවී ඇත.

## වර්තමානයේ ජල සම්පතට එල්ලවී ඇති බලපෑම

කෘෂි රසායනික ද්‍රව්‍ය හා රසායනික පොහොර වගා බිම් වලට අවශ්‍ය ප්‍රමාණයට වඩා අධික ලෙස භෝගවලට යෙදවීම නිසා මතුපිට මෙන්ම භූගත ජලයද දූෂණය වේ. උදා : නයිට්‍රේට් සහ පොස්පරස් එකතුවීම.

කර්මාන්තවලින් හා නාගරික ප්‍රදේශ වලින් පිටකරන අපද්‍රව්‍ය පිරිපහදුවකින් තොරව මතුපිට ජලස්කන්ධයට මුදා හැරීම. මෙම ජල දූෂණය හේතුවෙන් මත්ස්‍ය සම්පත්ද, ජල වාසස්ථාන විනාශ වීම නිසා ආහාර සැපයීම අඩුවී ඇත. එමෙන්ම වැව් සහ ගංගා මෝයවල ජීවත්වන මත්ස්‍ය සිරුරු තුල එක්රැස්වීම නිසා ඔවුන් ආහාරයට ගැනීමෙන් නොයෙකුත් රෝගාබාධ වලට මුහුණ දීමට මිනිසාට සිදුවේ. එමෙන්ම වැව් ආදිය සුපෝෂණය ඇතිවීම නිසා ජලය දූෂණය වේ. උදා : බේරේ වැව, නුවර වැව.

වනගහනය සීග්‍රයෙන් අඩුවීම ජල සම්පත හීනවීමට බලපායි. 1880 දී පමණ ලංකාවේ ස්වභාවික වනාන්තර 85% ක් පමණ පැවති වනගහන ප්‍රමාණය අදවන විට 20% ට වඩා අඩුවී ඇත. එසේම 1871 ප්‍රථම ජනගහන හා සංගණනය අනුව ලංකාවේ මිලියන 2.4 පමණ පැවති ජනගහනය 2001 ජනගහන හා සංඛ්‍යාලේඛන වලට අනුව මිලියන 19.0 පමණ වේ. 1871 සිට 2001 දක්වා කාලපරිච්ජේදය තුල වන ලැහැබ් 6 ගුණයකින් පමණ අඩු වී ඇති අතර ජනගහනය 8 ගුණයකින් පමණ වැඩි වී ඇත. ජනගහන වර්ධනය, වන සම්පත් අඩුවීමට ප්‍රබල ලෙස බලපායි. මේ නිසා අනාගතයේදී ජනගහනය වැඩිවීමත් සමගම තවදුරටත් වන ලැහැබ් අඩුවීම වැලැක්විය නොහැකි තත්වයකට පත්වී ඇත.

- කෘෂි ළිං මාර්ගයෙන් කෘෂි කර්මාන්ත කටයුතු සඳහා ජලය ලබා ගැනීම නිසා භූගත ජල මට්ටම පහළ යන අතර ජල උල්පත් සිඳීයාමේ තර්ජනයට මුහුණදී ඇත.

- පහත් බිම්වල සහ වගුරු බිම්වල කුණු කසල හිරවීම නිසා භූගත ජලය දූෂණය වේ. කොළඹ නගරයේ පමණක් දිනකට කුණු කසල මෙට්‍රික් ටොන් 500 ක් පමණ බැහැර කිරීම නිසා භූගත ජලය අපිරිසිදු වීමේ තර්ජනයකට මුහුණදී ඇත.

- ගංගා අපවිත්‍ර ද්‍රව්‍ය බැහැර කරන මාධ්‍යයක් ලෙස තෝරා ගැනීම



- බොහෝ නාගරික ප්‍රදේශ වලින් කුණු කසල ගංගා ඉවුරු වලට දැමීම. පොලිතින් වැනි දිරා නොයන අපද්‍රව්‍ය ජලාශවලට එකතු වීම, මල අපද්‍රව්‍ය එකතු වීම ආදිය නිසා ගංගා වලින් ජලය පාරිභෝජනය කරන අය හට විශාල සෞඛ්‍ය තර්ජන එල්ලවී ඇත. උදා : මහනුවර, පේරාදෙනිය, ගම්පොල, නාවලපිටිය වැනි නගර විවිධ ස්ථාන වලින් මහවැලි ගගට අපද්‍රව්‍ය එකතු වන අතර, මාඔය, කැළණි ගග, කලු ගග. වලවේ ගග, නිල්වලා ගග, මැණික් ගග, ගිං ගග වැනි ප්‍රධාන ගංගාවලටද අපද්‍රව්‍ය එකතුවීමෙන් විශාල වශයෙන් දූෂණයට ලක්වී ඇත. ඇළ දොල ගංගාවලින් සහ වැව්වලින් වාහන සේදීම, ගවයින් අලි වැනි සතුන් නෑවීමෙන්, මිරිදිය මත්ස්‍යය කර්මාන්තය සහ ඉස්සන් කර්මාන්තය නිසා වැවට සහ භූගත ජලය දූෂණය වේ.

- කඳුකර ප්‍රදේශවල සිදුවන අවිධිමත් ඉඩම් පරිහරණය නිසා ජල සම්පත් වලට ප්‍රබල තර්ජනයක් එල්ල වී ඇත. විශේෂයෙන්ම අධික බෑවුම්වල සිදු කරනු ලබන වන සහ ශාඛ ආවරණය ඉවත් කර පදිංචිය මෙන්ම නුසුදුසු වගා ක්‍රම වල ප්‍රතිඵලයක් වශයෙන් මතුපිට පස් තට්ටුව සේදීයාමෙන් ජලයෙහි බොරතාවය ඉහලයාම, ලංකාවේ මෙතෙක් විශාල ආයෝජනය කර ඉදිකරන ලද වික්ටෝරියා, රන්දෙනිගල, රන්ටැඹේ සහ පොල්ගොල්ල වැනි ජලාශ රොන් මඩ තැන්පත්වීමෙන් ඒවායේ ධාරිතාවය අඩු වීමෙන් විදුලිබල ධාරිතාවය අඩුවීම, එමෙන්ම වර්ෂාව නොමැති කාල වලදී කෘෂිකර්මය සඳහා ලබා ගත හැකි ජල ප්‍රමාණය ඩුවේ. කැලෑ කැපීම, ගිනිතැබීම, ශාඛා ආවරණය නොමැති කමින් භූගත පාංශු ස්ථර කරා ජලය කාන්දුවීම වෙනුවට තද වැහි කාලවලදී ඉතා ඉක්මනින් පොලව මතු පිට ගලායාම අධික වේ. එමෙන්ම නුසුදුසු වගා ක්‍රම වල ප්‍රතිඵලයක් වශයෙන් දැඩි මෝසම්කාල වලදී අධික පාංශුඛාදනය හා නායයාම් ඇතිවේ. පහත් බිම්වල ගංවතුර වැනි ආපදා ඇතිවේ. මේ නිසා වැහි වතුර ගලායාම අධික වන අතර ශාක මඟින් භූගත ජලය උරා ගැනීම අඩු වීමෙන් වියලි කාල වලදී ජල උල්පත් සිඳීයාමක් සිදුවේ. වන භූමි විනාශ වීමෙන් සත්ව හා ශාක ප්‍රජාවන්ගේ ජෛව විවිධත්වය හා ජෛව ක්‍රියාවලිය විනාශයට පත්වේ.

- සීමාවකින් තොරව කෙරෙන වැලි ගොඩ දැමීම නිසා ගංගා ඉවුරු කඩා වැටීම, ගග පලල්වීම, ගඟේ ගමන් මාර්ග වෙනස්වීම නිසා ඛාදනය අධිකවීම, ගග පතුල හෑරීම නිසා වර්ෂා ජලය නොමැති කාල සීමාවන්හිදී ගග පතුල මුහුදු මට්ටමට පහල යෑමෙන් මුහුදු ජලය ගග ඉහැත්තෑවට ගැලීම හේතුවෙන් පානීය ජලයට තර්ජනයක් වී ඇත. විශේෂයෙන් කැළණි ගඟේ මුහුදු



ජලය හන්වැල්ල දක්වා ගඟ ඉහැත්තෑවට ගලා ඇත. එමෙන්ම වැලි ගොඩ දැමීම නිසා පාලම් බෝක්කු සහ අමුනු වලට තර්ජනයක් වී ඇත. එමෙන්ම ගංගා පතුල පහලට යාම නිසා අවට ලිං වල භූගත ජල මට්ටම පහල යෑමෙන් වියලි කාල වලදී ජල හිඟයකට මුහුණ පෑමට සිදුවී ඇත.

- ගංගා සහ අතු ගංගා ආශ්‍රිත කෙරෙන මැණික් ගැරීම් උදා: කලු ගඟ නිසා ජලය දූෂණය වීමට ප්‍රබල තර්ජනයක් වී ඇත. තවද සංරක්ෂණ ක්‍රම වලින් තොරව ගොඩනැගිලි මංමාවත් ඉදිකිරීම වැනි යටිතල පහසුකම් වැනි සංවර්ධන කටයුතු ජල සම්පත් විනාශයට හේතු වේ.

මෙලෙස උග්‍ර වන ජල සම්පත් ප්‍රශ්න හමුවේ ශ්‍රී ලංකාවේ බොහෝ රටවල් මෙන්ම ජලය ආර්ථික භාණ්ඩයක් බවට පත්වී ඇත. අද ශ්‍රී ලංකාවේ බෝතල් කරන ලද ජලය ලීටර් 1 ක් රුපියල් 50 ක් පමණ වන අතර එය පිටරටින් ගෙන්වන ලද ඩීසල් ලීටර 1 ක් රුපියල් 30 ක් වන අතර පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 50 ක් වන අතර ලංකා කිරි ලීටරයක මිල රුපියල් 30 ක් පමණ වේ. මේ අනුව බලන කල අපේ ස්වාභාවික සම්පතක් වන ජලය අද වාණිජ භාණ්ඩයක් බවට පත්වී ඇත. මේ අනුව පෙනී යන්නේ පිරිසිදු පානීය ජලය පිළිබඳ ප්‍රශ්නයකට මුහුණ දී ඇති බවයි.

**ජල සම්පත් කළමනාකරණය කල යුත්තේ කෙසේද?**

ඉහල යන ජනගහණය හමුවේ ජල ඉල්ලුම වැඩිවේ. එමෙන්ම ජල සම්පත් හීනවීගෙන යන අතර ජලයද දූෂණය වෙමින් පවතී. එමනිසා පවතින ජල සම්පත් කළමනාකරණය ඉතා අවශ්‍ය වේ. විද්‍යාව හා තාක්ෂණය දියුණුවෙන් නොයෙකුත් දේ සොයාගත්තත්, නිෂ්පාදනය කලත් ජලය නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණය අපොහොසත් වී ඇති අතර ජලයට ආදේශකයක් සොයා ගැනීම අපහසුවී ඇත. එමනිසා එම ජල සම්පත් රැකගැනීමට නිසි කළමනාකරණයක් තුලින් අනාගතයේදී ඇති වන ජල ප්‍රශ්ණය විසදීම අපහසු කාර්යයක් නොවනු ඇත.

නොදුරු අනාගතයේදී මුහුණ දීමට සිදුවන ජල සම්පත් අර්බුදයට මුහුණ දීමට ජාතික මට්ටමේ දායකත්වයක් අත්‍යාවශ්‍යය. එබැවින් කාලීනව කල යුතුව ඇත්තේ තිරසාර සංවර්ධනයක් උදෙසා

ජල සම්පත් සංරක්ෂණය - ජල ඉල්ලුම පාලනය කොට පවතින සම්පත් කාර්යක්ෂමව පරිහරණය කිරීම

ජල සම්පත් සංවර්ධනය - තවදුරටත් ජල සම්පත් ලබාගැනීම සඳහා ජල සම්පාදනය,ජලවිදුලි සහ වාරි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ජල සම්පත් ආරක්ෂා කිරීම - ජලයෙහි ගුණාත්මක සහ ප්‍රමාණාත්මක භාවය හා ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියා

ජල සම්පත් ප්‍රතිස්ථාපනය කිරීම - දැනට ගුණාත්මක භාවය අඩාල වී ඇති ජල සම්පත් ප්‍රතිසංස්කරණය කොට නැවත යථා තත්ත්වයට පත් කිරීම.

ජල සම්පත් පාලනය කිරීම - ගංවතුරෙන් දිය බැස නොයෑම සහ ලවණ ජලය මුසුවීමෙන් සිදුවන හානි වැළැක්වීම

විනාශවී යන වන සම්පත ජලසම්පත් කළමනාකරණය කිරීමෙහිලා දීප ව්‍යාප්ත මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් මේ කර්තව්‍යයට සම්බන්ධ කළයුතුයි. එය රාජ්‍ය ආයතන වලට හෝ සංවිධාන වලට පමණක් කල නොහැක. ප්‍රජාවගේ සහභාගිත්වය, ශ්‍රම දායකත්වයෙන් ද්‍රව්‍යමය හා මුල්‍යමය දායකත්වය ලබාගත හැක. මේ සඳහා විනාශයට පත් ගංගා පෝෂිත ප්‍රදේශ සියල්ල අධ්‍යනය කර වනවගා ව්‍යාප්තිය ආරම්භ කල යුතුය. මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රජා මුල සංවිධාන ආරම්භ කර කළමනාකරණ කටයුතු ඔවුන්ට භාරදිය යුතුය.

ගංගා සහ ජල මුලාශ්‍ර ආශ්‍රිතව සිදුවන දූෂණ හා හානි වැලැක්වීමට පියවර ගතයුතු අතර ඒ සඳහා ප්‍රජාව දැනුවත් කිරීම වැදගත් වේ. දැනටමත් අඹලන්වී ඇති සහ රොන් මඩ පිරී ඇති වැව් සහ පොකුණු පිරිසකර කර ජලය රැස්කිරීමට පියවර ගැනීමට මේ සඳහා ප්‍රජාවගේ දායකත්වය ලබාගැනීම.

ජලසම්පත් හිඟ ප්‍රදේශවල විශේෂයෙන් මොණරාගල, හම්බන්තොට වැනි දිස්ත්‍රික්කවල ජනතාවට වැසි ජලය, ටැංකි භාවිතය පිළිබඳ උනන්දු කරවීම ඒ සඳහා තාක්ෂණ දැනුම සහ මුල්‍ය ආධාර ලබාදිය යුතුයි.

ජල සම්පත් විනාශවීමේ තර්ජනයට මිනිස් ක්‍රියාකාරකම් ඍජුවම හේතු සාධක වී ඇති බවයි. කෙසේ වෙතත් මෙම ජලසම්පත් කළමනාකරණය නොකර මෙම මිහිතලය මත පිපාසය සංසිඳවීමට ජල බිඳක් ලබාගැනීම අසීරු බව මිනිසාට කවර කලකට වඩා දැන් පැහැදිලි වී ඇත. එම නිසා ඉතිරිවී ඇති සීමිත ජලසම්පත් ප්‍රමාණය මනා කළමනාකරණයකින් යුතුව මතු පරපුර උදෙසා ජල සම්පත් සුරැකීම අප සියළුදෙනාගේම යුතුකමකි.

***සුනිල් ජයවීර***
***විද්‍යාඥ***
***මානව ජනාවාස අංශය***
***ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය***
***99/1, ජාවත්ත පාර,***
***කොළඹ 05.***